**හක්මන ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හක්මන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය රු.5,818,142 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ කර්මාන්ත 16 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය වැඩියෙන්ද, කර්මාන්ත 02 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය අඩුවෙන්ද දැක්වීම නිසා ශුද්ධ ණයහිමි ප්‍රතිපාදනය රු.1,887,447 අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලට අදාල සංවර්ධන වැඩ යෝජනා 11 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.952,336 ක මුදල සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදි කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු රු. 8,123,222 ක්වූ මුදල මූල්‍ය ප්‍රකාශනවලින් අත් හැරී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂවලට අදාළ සංවර්ධන ව්‍යාපෘති 02 ක් සඳහා ලැබිය යුතු මුදල රු.1,962,387 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ආදාහනාගාර ගොඩනැගිල්ලේ රු.7,650,000 ක් වූ නව තක්සේරු වටිනාකම ගිණුම්වල දැක්වීමේදී පෙර තක්සේරු වටිනාකම හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(උ) වටිනාකම රු.200,000 ක් වූ ඉඩම් දෙකක් ස්ථාවර වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඖ) සමාලෝචිත වර්ෂය තුළ මිලට ගෙන තිබූ එකතුව රු.1,901,449 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඵ) සභාවට අයත් ඉඩමක ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ලේ වටිනාකම සහ සභාවට ලැබී තිබූ ඉඩමක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

----------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 20,506,233 ක් වූ ගිණුම් විෂයයන් 18 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර අසමානතාවල එකතුව රු.6,666,045 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

-------------------

නිරවුල් කිරීමට පියවර නොගෙන දිගින් දිගටම ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු.873,211 ක හර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද පියවර ගෙන නොතිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.14,873,739 ක්වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.4,721,448 ක ශේෂ 91 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවල සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.361,434 ක්වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ 04 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.56,267,658 ක්වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.3.6 අනුකූල නොවීම

### 1.3.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව එකතු කර ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. |
| (ii) රීති 212 | තොග ලේඛනයේ ලැබීම් සටහන් කිරීමේදී ගෙවීම් වවුචර් අංක හා දින සටහන් කර නොතිබුණි. |
| (iii) රීති 213 | ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමේදී සභා ලේකම්ගේ අනුමැතිය ලබා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඈ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල වලංගු කාලය ඉක්මවූ එකතුව රු.41,453 ක් වූ චෙක්පත් 16 සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) අංක 2014/3 හා 2014/3 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව ප්‍රජා සංවර්ධන නිලධාරිනිය සඳහා වර්ෂය තුළ දුරකථන ගාස්තු ලෙස රු.18,750 ක් ගෙවා තිබුණි. |
| (ඈ) නාගරික සංවර්ධන අධිකාරියේ 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119/ච(ix) දරන උපදෙස් ලිපිය | සැළසුම් කමිටු දීමනාව ගෙවීම සඳහා පැය 02 කට වැඩි කාලයක් රාජකාරි වේලාවෙන් බැහැරව කටයුතු කළ යුතු වුවද ඊට අදාළ නොවන අයුරින් රු.51,750 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,773,619 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,636,949 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පොදු ගිණුමට තැන්පත් කර තිබූ රු.15,910 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන තෙක් උපලබ්ධි වී නොතිබූ අතර, ඒ පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි.

(ආ) කුරුඳු පියස ජල යෝජනා ක්‍රමයට අදාළ ආදායම් රැස් කිරීමේ ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට තිබූ රු.2,433,370 ක මුදල, ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර ආදායම් උපයා ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,032,500 | 1,579,059 | 1,416,768 | 1,098,593 | 422,500 | 1,048,155 | 856,363 | 936,302 |
| කුලී | 6,078,586 | 5,973,118 | 5,846,340 | 494,010 | 5,430,885 | 5,166,564 | 5,025,462 | 367,232 |
| බලපත්‍ර ගාස්තු | 789,000 | 378,910 | 373,560 | 11,050 | 961,000 | 758,725 | 753,025 | 5,700 |
| වෙනත් ආදායම් | 8,023,550 | 11,270,260 | 7,831,657 | 14,036,728 | 34,334,002 | 11,471,175 | 6,860,712 | 10,598,125 |
| -එකතුව- | 15,923,636 | 19,201,347 | 15,468,325 | 15,640,381 | 41,148,387 | 18,444,619 | 13,495,562 | 11,907,359 |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය
-------------------------------------

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත මුළු ආදායම රු.15,923,636 ක් වූ අතර බිල් කළ ආදායම රු.19,201,347 ක් විය. රු.11,907,359 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.31,108,706 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.15,468,325 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.15,640,381 ක් වී තිබුණි.

2.3.3 වරිපනම් හා බදු
------------------

(අ) වරිපනම්
----------

ආරම්භක හිඟය රු.673,385 ක් වූ අතර, රු.1,048,097 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,721,482 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.891,776 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.829,706 ක් හිඟව පැවතුණි.

(ආ) අක්කර බදු
------------

ආරම්භක හිඟය රු.49,630 ක් වූ අතර, බිල් කිරීම් රු.7,100 ක් සමග රු.56,730 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.9,130 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.47,600 ක් හිඟව පැවතුණි.

(ඇ) ජල ගාස්තු
-----------

ආරම්භක හිඟය රු.344,970 ක් වූ අතර වර්ෂයේ බිල්කිරීම් සමඟ වර්ෂය තුළ රු.1,047,732 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.470,692 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.577,040 ක් හිඟව පැවතුණි.

2.3.4 බදු කුලී
----------

ආරම්භක හිඟය රු.374,927 ක් වූ අතර, රු.2,301,575 ක් වූ බිල්කිරීම් සමග රු.2,676,502 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු. 2,174,797 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.501,705 ක් හිඟව පැවතුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,486,304 ක් හා මුද්දර ගාස්තු රු.10,600,848 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිලිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අපේක්ෂිත නිමවුම් මට්ටම (output) ලබා නොගැනීම**

-------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට අනුව සභා අරමුදලින් සංවර්ධන වැඩයෝජනා 29 ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදී තිබුණද වර්ෂය තුළ රු.662,000 ක් වූ එක් වැඩයෝජනාවක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) **අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම**

-------------------------------------------------------

පරිසර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පරිසර මාවතක් ඉදිකිරීමට රු.2,900,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, අදාළ කර්මාන්තයේ මංතීරුවක් පමණක් ඉදිකිරීමට රු.1,998,229 ක් 2017 පෙබරවාරි 22 දින වැයකර තිබුණි. ඉතිරි මුදල පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ රඳවාගෙන තිබුණි. පරිසර මාවත ඉදිකළ ස්ථානය ඇවිදින මංතීරුවක් ලෙස පාවිච්චි කළ නොහැකිව තිබූ අතර, මාර්ගයේ ජලය බැස යාමටද බාධා වී තිබුණි. මේ නිසා කර්මාන්තය අපේක්ෂිත අරමුණ සඳහා යොදවාගත නොහැකිවී තිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් ඉදිකිරීමට 2012 වර්ෂයේදී සභා අරමුදලෙන් රු.1,000,000 ක් ගෙවා ඉඩමක් මිලදීගෙන තිබුණි. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය එම කර්මාන්තය ඉටුකිරීම සඳහා 2016 වර්ෂයේදී රු.9,411,898 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු නමුත් 2017 වර්ෂය අවසන්වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ii) වර්ගීකරණයකින් තොරව එකතු කරනු ලබන කසළ, බාහිර ඉඩමකට බැහැර කර පස් දමා වැසීමට කටයුතු කර තිබුණි.

(iii) කසළ එකතු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී 4,341,750 ක් වියදම් කර තිබූ නමුත් කිසිඳු ආදායමක් උපයා ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

(ඈ) **තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 02 සම්පූර්ණකර ගැනීමටත්, 13 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ii) ක්ෂේත්‍ර හා සෞඛ්‍ය කම්කරුවන් ලෙස බඳවාගෙන තිබූ සේවකයන් 19 දෙනෙකුගෙන් 10 ක් අදාළ රාජකාරිවලින් බැහැරව කාර්යාලය තුල වෙනත් රාජකාරිවල යොදවා ගෙන වැටුප් සහ අතිකාල දීමනා ලෙස රු. 1,538,384 ක් ගෙවා තිබුණි.

(iii) භාණ්ඩාගාර ලේකම්ගේ 3/2014 හා 25/2014 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි සේවකයන් 5 දෙනෙකු බඳවාගෙන 2016 වර්ෂයේ සිට 2017 දෙසැ 31 දක්වා රු.1,412,508 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

### (ආ) සේවක ණය

සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවක ණය ශේෂය රු. 4,882,131 ක් වූ අතර, එකී ශේෂය තුළ වර්ෂ 03 කට වැඩි කාලයක සිට වාරික සහ පොලී අය නොවී රු.93,329 ක් පැවතුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂය තුළ වීථි පහන් නඩත්තුව සඳහා රු.315,090 ක උපකරණ මිලදී ගෙන ඉන් රු. 219,850 ක උපකරණ විදුලි කාර්මිකයා වෙත නිකුත් කර තිබුණි. වීථි පහන් නඩත්තුව පිළිබඳව සභාවේ කිසිඳු අධීක්ෂණයක් සිදුවී නොතිබුණි. සවි කිරීමට ලබාදී තිබූ රු. 103,185 ක වීථි පහන් කට්ටල 09 ක් හා රු.21,396 ක උපකරණ සවි කිරීම් නොකර විදුලි කාර්මික බාරයේ තිබුණි. විදුලිබල මණ්ඩලයේ අනුමත වීථි පහන් කණු සංඛ්‍යාව 102 ක් වූ අතර, ඊට අනුකූල නොවන ලෙස වීථි පහන් කණු 612 ක් සභාව විසින් නඩත්තු කර තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

සභාවට ලැබී තිබූ ඉඩම් 02 ක් ලේඛනවල ඇතුළත් කර නොතිබුණි.

### 3.4.2 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉඩම් හා ගොඩනැඟිලි

රු.352,500 ක් වටිනා ඉඩම් 07 ක් හා ගොඩනැගිලි නිශ්ක්‍රීයව සහ ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) යන්ත්‍රෝපකරණ

2010 මාර්තු 19 දින සභා අරමුදලින් මිලදීගෙන තිබුණු රු.130,862 ක් වටිනා කුට්ටි ගල් මැෂිම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.

(ඇ) මෝටර් රථ හා කරත්ත

සභාව සතුව පැවති රු.470,000 ක් වූ වාහන 05 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවති අතර වාහන අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(අ) මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ එක් පෞද්ගලික නිවසකට යාමට පමණක් රු. 488,931 ක් වැයකර මාර්ගයක් ඉදි කර තිබුණි.

(ආ) දිළිඳු පවුල් වැඩි වශයෙන් ජීවත් වන ප්‍රදේශවල ජනතාවගේ මූලා අවශ්‍යතා හා ජීවනෝපායන් වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2017 දෙසැම්බර් 31 දිනට රු.2,281,032 ක් වැය කර වලං නිෂ්පාදන ආයතනයක් සංවර්ධනයකර තිබුණද ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූලා කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 06 ක එකතුව රු. 5,499,980 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම අගයන් සියයට 02 සිට 59 දක්වා පරාසයක පැවතුණි.

(ආ) තවත් වියදම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.124,867 ක් වූ අතර, එම අගයන් සියයට 02 ක් හා සියයට 52 ක් ව පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.3,347,157 ක්වූ අතර, එම අගයන් සියයට 02 සිට සියයට 09 දක්වා පරාසයක පැවතුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර එකඟතාවයක් ලබාගෙන නොතිබූ අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) අයවැය පාලනය

(ඇ) ගිණුම්කරණය